# 20 ආජීව අට්ඨමක සීලය

කරුණාජීව උපාසක මහතා කිසිම කෙනෙකුට කරදරයක් නොවන පරිදි යහපත් ජීවිතයක් ගත කරන කෙනෙක්. ඒ පවුලේ අයත් එහෙම යි. ඔහු කිසිම දිනෙක දන් වේල වරද්දන්නෙ නෑ. විහාරස්ථානයේ සිදුවන පොදු වැඩවලදීත් කාට හෝ කරදරයක් වූ විටකදීත් ඊට සම්බන්ධ වෙලා වැඩ කිරීම කරුණාජීව උපාසක මහතාගේ සිරිතකි.

දිනක් කරුණාජීව මහතා විහාරස්ථානයට පැමිණිලා තෙරුවන් වැඳලා, මල් පහන් ආදිය පූජාකොට අනතුරුව ගියේ ලොකු හාමුදුරුවන් වහන්සේ හමුවෙන්න යි. උන්වහන්සේ වැඳ නමස්කාර කිරීමෙන් අනතුරුව ඔහු ලොකු හාමුදුරුවන්ගෙන් මෙහෙම ඇහුවා. "අවසරයි අපේ හාමුදුරුවනේ මම පන්සිල් රකින කෙනෙක් මට උවමනයි ඒ සීලය තව ටිකක් දියුණු කරගන්න. ඒ වුණාට අපේ හාමුදුරුවනේ පෝය දවසේ අටසිල්, දසසිල්, සමාදන්වෙන්න නම් මට අමාරුයි. පෝය දවසට සමාදන් වන අටසිල් දසසිල් හැරුණුකොට තවත් මොනව හරි සිල් ක්‍රමයක් තියෙනවද සමාදන් වෙන්න."

කරුණාජීව උපාසක මහතා ඇසූ ප්‍රශ්නය ලොකු හාමුදුරුවන්ට හොඳට පැහැදිලි යි. උන්වහන්සේ ඊට පිළිතුරක් දුන්නා.

"ඔව් උපාසක මහත්තයෝ එහෙම සීලයක් තියෙනවා. ඒකට කියන්නේ **ආජීව අට්ඨමක සීලය**" කියලයි. මේ අහන්නකො.....

1. **පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
2. **අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
3. **කාමෙසු මිච්ඡාචාරා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
4. **මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
5. **පිසුනා වාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
6. **ඵරුසා වාචා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**

7. **සමඵප්පලාපා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**
8. **මිච්ඡාජීවා වෙරමණී සික්ඛාපදං සමාදියාමි**

තේරුම

1. පරපණ නැසීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
2. නුදුන් දේ ගැනීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
3. කාමයන් හි වරදවා හැසිරීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
4. බොරුකීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
5. කේලම් කීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
6. පරුෂ වචන කීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
7. නිෂ්ඵල වචන කතා කිරීමෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.
8. වැරදි ජීවිකාවෙන් වැළකීමේ සිකපදය සමාදන් වෙමි.

පන්සිල් හොඳට හුරු පුරුදු කළ සැදැහැවත් බෞද්ධයන් සීලයෙන් වැඩි දියුණු වීමට මේ **ආජීව අට්ඨමක සීලය** සමාදන් වෙනවා.

මෙය ආරක්ෂා කරන්න අටසිල් දසසිල්වලට මෙන් ම ගෙදරින් ඈත්වෙලා පන්සලට පැමිණිය යුතු නෑ. තමාගේ දවසේ වැඩ පිළිවෙළ වෙනස් කර ගත යුතු නෑ. ගෙදර දොරේ වැඩ, රැකියාවේ වැඩ ආදී සියලු කටයුතු කරන අතර ම මෙම සීලය රකින්න පුළුවන්. මෙම සීලයේ තිබෙන විශේෂ දේ නම්,

"වැරදි රැකියාවන්ගෙන් වැළකීමට පොරොන්දු වීමයි"

මේ සීලයට **ආජීව අට්ඨමක සීලය** කියන්නේ ද එම ශික්ෂාපදය අටවෙනි කොට ඇති හින්දයි. ඊට අමතරව පන්සිල්වලට වඩා මෙහි ඇති වෙනස නම් වචනයෙන් කෙරෙන අකුසල් හතරම මෙහි ඇතුළත් ව තිබීම යි. ඒ අනුව මෙම සීලයෙන් කය, වචනය, ජීවන රටාව යන අංග තුනම පිරිසිදු වෙනවා. එවිට සියලු සිල් ආරක්ෂා කළා වෙනවා. ඒ වගේ ම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යන මාර්ගාංග තුන ම මේ සීලයෙන් සම්පූර්ණ වෙනවා.

"ඉතින් අපේ උපාසක මහත්තයට පුළුවන් පන්සිල්වලට අමතරව මේ **ආජීව අට්ඨමක සීලය** සමාදන්වෙලා රකින්න."

"එහෙමයි අපේ හාමුදුරුවනේ ඒ විදිය හොඳයි. එහෙනම් මට යන්න අවසරයි." ලොකු හාමුදුරුවන්ගේ දෙපා නමැද අවසර ගත් කරුණාජීව උපාසක මහතා සිය නිවස බලා පිටත් වුණා.

**ක්‍රියාකාරකම 20.1**

සුදුසු වචන යොදා පහත සඳහන් ඡේදයේ හිස්තැන් පුරවන්න.

(අටසිල්, පන්සිලුත්, ආලෝකය, උදව්, ප්‍රයෝජනවත්, ජීවිතය, ජය, ලස්සන, සීලයයි, ගිහි)

ගිහි ................................ බාධක කම්කටොලු කරදර සහිත ය. බුදුදහමේ ................................ ලබන ගිහියා ඒ බාධක කරදර ................................ ගනිමින් ................................ ජීවිතයක් ගත කරයි. ඊට ඔහුට ගොඩක් ................................ වන්නේ ඔහු රකින ................................ නිත්‍ය සීලය වශයෙන් ................................ අනෙකුත් ................................ . දසසිල් වගේම ආජීව අට්ඨමක සීලයත් සමාදන් වීම ................................ ජීවිතයට ................................ වේ.

## පුහුණුවට

සබ්බදා සීල සම්පන්නො
පඤ්ඤවා සුසමාහිතො
ආරද්ධ විරියො පහිතත්තො
ඕඝං තරති දුත්තරං

හැමදා සිල් රකින, ප්‍රඥාවෙන් යුත්, හිත සංවර කර ගත්, පටන් ගන්නා ලද වීර්යය ඇති තැනැත්තා එතෙර වීමට අපහසු වූ සසර සැඩ පහර තරණය කරයි.

## ජීවිතයට ඔවදනක්

සිත දමනය කිරීම යහපත් ය
දමනය වූ සිත සැප ගෙන දෙයි.